පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාව
-----------------------------------
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------------

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 19 ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 25 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර, 2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 නොවැම්බර් 22 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වෙළඳ බලපත්‍ර ලේඛනයට අනුව 2015 වර්ෂයේ දී ලැබී තිබූ වෙළඳ බලපත්‍ර ගාස්තු රු. 153,975 ක් වුවද, එය රු. 114,700 ක් ලෙස ආදායම් හා වියදම් ගිණුමට ඇතුලත් කර තිබීමෙන් ආදායම රු. 39,275 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වෙළඳ බලපත්‍ර ලේඛනයට අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තුවල වටිනාකම රු. 314,800 ක් වුවද, එය ශේෂ පත්‍රයේ රු. 46,700 ක් ලෙස දැක්වීම නිසා වත්කම් රු. 268,100 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල කඩකාමර කුලී ආදායම රු. 419,627 ක් වුවද, ආදායම් හා වියදම් ගිණුමේ රු. 263,889 ක් ලෙස දක්වා තිබුණෙන් රු.155,738 කින් ආදායම අඩුවෙන් දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
--------------

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,630,456 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,029,656 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,399,200 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

## 2. 2 ආදායම් පරිපාලනය

----------------------

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| ---------------- | ---------- | ---------- | --------------- |
| | රු..000 | රු.000 | රු.000 |
| බදු කුලී | 988 | 904 | 101 |
| බලපත්‍ර ගාස්තු | 161 | 161 | 49 |
| වෙනත් ආදායම් | 7,496 | 9,430 | 824 |

### 2.2.2 වෙනත් ආදායම්

------------------

සභා බල ප්‍රදේශය තුල සන්නිවේදන කුළුණු හතරක් පැවති අතර, එම කුළුණු පවත්වා ගෙන යාම වෙනුවෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා අදාල ආයතන වලින් ගාස්තුවක් අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් සභාවට උපයාගත හැකිව තිබූ ආදායමක් අහිමි වී තිබුණි .

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) 2005 අංක 03 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර (2007 අංක 13 හා 2009 අංක 18 දරන මුදල් සංශෝධන පනත්වලින් කරනු ලබන සංශෝධනවලට යටත්ව) සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සිංහපුර ළමා සායන මධ්‍යස්ථානය , පරණ මැදවච්චිය සායන මධ්‍යස්ථානය හා ජයන්ති වැව සතිපොල යනාදිය ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබූ රු. 53,484,226 ට අදාල කර්මාන්ත සහතික අරමුදල් බද්ද (CIGFL) වන රු. 133,711 ක් රඳවාගෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමකින් තොරව ගොඩනැගිලි ඉදිකර තිබූ අතර, එම ඉදිකිරීම්වල හා ඉඩම්වල වටිනාකම රු. 91,107,364 ක් මූල්‍ය ප්‍රකාශන තුල ඉඩම් හා ගොඩනැගිලි ලෙස දක්වා ඇති නමුත් සභාව විසින් මෙම ගොඩනැගිලි ඉදිකර ඇති ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.අ

(ඇ) 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුකූලව සහ 2008 ක් වූ ජනවාරි 25 දිනැති අංක 1523/16 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන වඩු කර්මාන්ත, බ්ලොක් ගල් නිෂ්පාදන කර්මාන්ත සහ වී මෝල් 50 ක් සඳහා එම බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

3.2 වාහන උපයෝජනය

-------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 ජුලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2015 අනුව මෝටර් රථ සඳහා රක්ෂණාවරණ ලබා ගැනීමේ දී රජය සතු ආයතන වෙතින් ලබාගත යුතු වුවත්, වාහන දෙකක් සඳහා පෞද්ගලික රක්ෂණ ආයතන වෙතින් රක්ෂණාවරණ ලබාගෙන තිබුණි.

(ආ) පළාත් පාලන ආයතනවල නඩත්තු ඒකක සඳහා අවශ්‍ය මූලික යන්ත්‍ර සූත්‍ර ලබාදීමේ වැඩසටහන හා පළාත් පාලන ආයතනවල ප්‍රවාහන පහසුකම් සැලසීමේ වැඩසටහන යටතේ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් සභාවට ලබාදුන් වාහන 08 කට අදාලව අයිතිය සභාව වෙත පවරා ගැනීමට 2016 සැප්තැම්බර් 29 වන විට ද කටයුතු කර නොතිබුණි.

3.3 වත්කම් කළමණාකරණය

----------------------------

3.3.1 ඌණ උපයෝජිත වත්කම්

------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති අංක 185 ට අනුව සභාවේ මුදල් එදිනෙදා අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි යැයි සලකණු ලැබේ නම්, සභාවේ එකඟතාවය ඇතිව ස්ථිර තැන්පතු වශයෙන් බැංකුවක තැන්පත් කල යුතු වුවද, ප්‍රාදේශීය සභාව විසින් මහජන බැංකුවෙහි පවත්වාගෙන යන ගිණුමෙහි 2015 වර්ෂයෙහි සෑම මාසයක්ම අවසානයේ දීම රු.ලක්ෂ 12 ත්, ලක්ෂ 42 අතර මුදලක් පැවතුණි.

(ආ) සභාව විසින් 2015 ජනවාරි 27 වන දින රු. 485,000 ක මුදලක් වැයකර ජල සාම්පල් පරීක්ෂණ කට්ටලයක් හා ජල පිල්ටර් දෙකක් මිලදී ගෙන තිබුණු නමුත් එම ජල සාම්පල් පරීක්ෂා කිරීමට තාක්ෂණික දැනුමැති නිලධාරියෙකු නොමැතිවීම හේතුවෙන් 2016 අගෝස්තු 29 දින වන විටද එය භාවිතයට ගත නොහැකි වී තිබුණි.

(ඇ) පළාත් පාලන හා පලාත් සභා අමාත්‍යාංශ මඟින් 2006 වර්ෂයේ සභාවට ලබා දී තිබූ කැබ් රථය 2015 වර්ෂයේ සිට ක්‍රියා විරහිතව වාහන අංගනයේ ගාල්කර තිබුණද, ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

3.3.2 භාණ්ඩ සමීක්ෂණය

----------------------

භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව භාණ්ඩ ලේඛනයට ඇතුලත් නොකරන ලද භාණ්ඩ 72 ක් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට 2016 සැප්තැම්බර් 29 දින වන විටද කටයුතු කර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ප්‍රජා සහභාගිත්වයෙන් බට එළීම සඳහා සභාවට 2012 සහ 2013 වර්ෂයන් වලදී ලබා දී තිබූ UPVC බට සහ සවිකිරීම් වලින් ඉතිරි වී තිබූ 3000 ක පමණ බට තොගයක් පදවි ශ්‍රී පුර , ජයන්ති වැව සහ සමන්පුර යන ගබඩාවල අවිධිමත් ලෙස ගබඩා කර තිබූ අතර, එම බට තොගය විධිමත්ව ගබඩා කිරීමටත් වෙනත් කාර්යයක් සඳහා භාවිතා කිරීමටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

### 3.5.1 ජයන්තිවැව සතිපොල ඉදිකිරීම

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ජයන්තිවැව සතිපොල ඉදිකිරීම වෙනුවෙන් රු. 7,682,087 ක වටිනාකමකට මාස 06 ක කාලයක් තුල ඉදිකිරීම් අවසන් කිරිමේ පදනම මත 2013 ඔක්තෝම්බර් 09 දින කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) පළමු කොන්ත්‍රාත්කරු විසින් වැඩ ආරම්භ නොකිරීම නිසා එම කොන්ත්‍රාත්තුව දෙවන කොන්ත්‍රාත්කරුට රු. 8,428,900 ක වටිනාකමට 2014 ජනවාරි 20 දින ලබා දී තිබුණි. මේ හේතුවෙන් සභාවට දරන්නට සිදු වූ පාඩුව වන රු. 746,813 ක මුදල පළමු කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට තීරණය කලද රු. 384,105 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ආ) දෙවන කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුමට අනුව කොන්ත්‍රාත්තුව 2014 අප්‍රේල් 19 දින අවසන් කල යුතු වුවද, වැඩ අවසන් කර සභාවට භාරදී තිබුණේ 2014 ඔක්තෝම්බර් 20 දින වූ අතර, ගිවිසුමේ කොන්දේසි අංක 6.4 ප්‍රකාරව අයකල යුතු ප්‍රමාද ගාස්තුව රු. 771,244 මුදල අයකිරීමට 2016 සැප්තැම්බර් 29 දින වන විටද කටයුතු කර නොතිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

### අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| විධායක මට්ටම | 02 | - | 02 |
| ද්වීතික මට්ටම | 17 | 10 | 07 |
| තෘතීය මට්ටම | 24 | 21 | 03 |
| එකතුව | 43 | 31 | 12 |

ආයුර්වේද වෛද්‍ය නිලධාරී, කළමනාකරණ සහකාර, තාක්ෂණික නිලධාරී, පුස්තකාලයාධිපති, විදුලි කාර්මික නිලධාරී සහ රියදුරු තනතුරුවල වර්ෂ 02 සිට 05 දක්වා කාලපරිච්ඡේදයක සිට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට 2016 සැප්තැම්බර් 29 දින වන විටද කටයුතු කර නොතිබුණි

4. පද්ධති හා පාලන
-----------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| පද්ධතිය | | අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ආදායම් ගිණුම්ගත කිරීම. |
| (ආ) | ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අයකර ගැනීම |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | (i) ප්‍රමාද ගාස්තු අය කිරීම. |
| | | (ii) කොන්ත්‍රාත් බදු මුදල් ගෙවීම . |